මව්බිම ලංකා පදනම
மௌபிம லங்கா பதனம
Mawbima Lanka Padanama
A4, PERAHERA MAWATHA, COLOMBO 3. TEL: 011-5758558 FAX: 011-2452094
www.gannaapede.com email: info@gannaapede.com

අතිගරු ජනාධිපතිතුමනි,

## කෝවිඩ් වසංගතයෙන් පසුව ජාතික නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා යෝජනා

### 1. උපාය මාර්ගික වශයෙන් වැදගත්වන මූලික ප්‍රතිපත්තිමය කරුණුඃ-

**(1.1)** දේශිය නිෂ්පාදන ආර්ථිකය ශත්තිමත් කිරිම සදහා ආනයන අධයිමත් කළ යුතු බව සහ ආනයන සදහා දේශිය විකල්ප නිෂ්පාදන දිරිමත් කළ යුතු බව, එනම් ආරක්ශනාවාදය, ජාතික ප්‍රතිපත්තියක් ලෙස පිළිගැනීම.

**(1.2)** එම ප්‍රතිපතියට අදාලව රටේ ජනතාවගෙන් වැඩි පිරිසකට ආර්ථික ඉඩ ප්‍රස්ථා සලසන සහ රටේ ආහාර සුරක්ෂිතාවය මත සහ වෙළදපල තුල වීශාල බලපැමක් ඇතිකරන ආහාර වෙළදපලවල් හදුනාගෙන ඊට අදාල ආනයනික නිෂ්පාදන මගින් වෙළදපල තුල මිළ විකෘතීන් ඇති කිරිම වැලැක්වීම යනු දේශිය නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම සදහා වන පූර්ව කොන්දේසියක් ලෙස පිළිගැනීම.

**(1.3)** එසේ තොරාගත් වැඩි බලපැමක් සහිත වෙළදපොල තුල (උදාහරනයක් ලෙස තිරිගු පිටි සහ සහල් අතර තරගකරි වෙළදපල, ආහාරයට ගන්නා තෙල් වර්ග වෙළදපල සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන වෙළදපල) පවතින මිළ විකෘතීන් නිවැරදි කිරිම සදහා බදු පැනවිමේදී කෙටි කාලිනව ආනයනික ද්‍රව්‍යය වල මිළ ඉහල යෑම මගින් ඇතිවිය හැකි මහජන විරෝධය සමනය කිරිම සදහා විනිවිදභාවයෙන් යුතුව අදාල බදු ප්‍රතිපත්තිය, විශේයෙන්ම දේශිය නිෂ්පාදන වියදම මත මිළ සුත්‍රය සකස් කරන ආකාරය සහ දේශිය නිෂ්පාදනවල මිලට වඩා අවම වශයෙන් 5-10% කින් අතර ප්‍රතිශතයක් ආනයනික ද්‍රව්‍යය වල මිල ඉහළ මට්ටමක තැබීම සදහා බදු පැනවිමේ සුත්‍ර සකස් කරන ආකාරය පිළිබද තොරතුරු මහජනයාට ලබා දීම සහ ඒ පිළිබදව මහජන සංවාදයක් ඇති කොට එම උපාය මර්ගික ප්‍රවේශයට මහජන සහය ලබාගත යුතු බව පිලිගැනිම.

**(1.4)** එසේ වෙළදපල මිල විකෘතීන් නිවැරදි කිරීම සදහා බදු පැනවීමේදී (ඉතා වැදගත් වෙළදපල කිහිපයකට අදාලව පමණක්) මහජන විරෝධය සමනය කිරීම සදහා එම බදු අරමුදල් විශේෂ අරමුදලකට බැර කොට, එම අරමුදල් දේශීය නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු කිරීම සදහා පමණක් යොදවන බව සහතික කිරීම සහ ඒ මගින් දේශීය නිෂ්පාදන වැඩි කොට නැවත මිල අඩු කිරීමේ හැකියාව තිබෙන බව සහතික කිරීම.

**(1.5)** රටේ බහුතර ජනතාවකට ආර්ථික ඉඩ ප්‍රස්ථා සැළසෙන හා රට සතු සම්පත් වලින් උපරිම ඵල නෙලා ගැනීම මුල් කරගෙන සුවිශේෂී මහා පරිමාණ කර්මාන්ත ප්‍රමාණයක් ආරම්භ කිරීම සහ ඒ සදහා දේශීය ආයෝජකයින්ට ආරාධනා කිරීම. (එහිදී මව්බිම ලංකා

පදනමට මූලික වටයේදී පහත සදහන් කර්මාන්ත සඳහා ආයෝජකයින් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත)

**I)** රට තුල හු ගෝලීයව පැතිරී යන ලෙස කිරි සකස් කිරීමේ කර්මාන්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා කුරුණෑගල, වව්නියාව සහ කන්තලේ යන ප්‍රදේශ වල කිරි කර්මාන්ත ශාලා 3ක් ආරම්භ කිරීම.

**II)** කන්තලේ ඇතුළු වසා දමා ඇති සහ අර්ධ කාර්‍යක්ෂමතාවයෙන් පවත්වාගෙන යන සීනි කර්මාන්ත ශාලා වලට නැවත පණ දීම සහ මුඩු බිම් පමණක් යොදා ගනිමින් නව කර්මාන්ත සීනි ශාලාවක් ආරම්භ කිරීම.

**III)** මිනිරන් අමුද්‍රව්‍ය ලෙස අපනයනය කරිම වෙනුවට "කළු රත්තරන් හෙවත් ග්‍රැෆීන් ලෙස වටිනා කම් එකතු කොට අපනයනය කිරම සඳහා කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම.

**IV)** ඛණිජ වැලි අමුද්‍රව්‍ය ලෙස අපනයනය කිරීම වෙනුවට වටිනා ලෝහ නිස්සාරණය කොට අපනයනය කිරීමේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම.

## 2. ආණ්ඩුව විසින් ගත යුතු නිශ්චිත ක්‍රියා මාර්ග

**(2.1)** සහල් සහ තිරිගු පිටි අතර තරගකාරී වෙළඳපල, ආහාරයට ගන්නා තෙල් වෙළඳපල සහ කිරි ආහාර වෙළඳපල යන වෙළඳපල 03 තුල පමණක් පවතින මිල විශමතා නිවැරදි කිරීම සඳහා විශේෂ පාරිභෝගික බදු පැනවීම. එසේ බදු ගණනය කිරීමේදී දේශීය විකල්ප නිෂ්පාදන වල මිලට වඩා ආනයනික ද්‍රව්‍යයන් වල මිල 10% කින් ඉහල මට්ටමක පවතින ලෙස බදු ප්‍රමාණයන් නිර්ණය කල යුතුය. (එම ක්‍රියාවලිය විනිවිධ භාවයෙන් යුතුව සිදු කල යුතු අතර සියළු තොරතුරු මහජනයාට ලබා දී මහජන සංවාදයක් ඇතිකොට මහජන සහය ලබා ගත යුතුය. එසේම එම බදු අරමුදල් විශේෂ අරමුදලකට බැර කොට ඒවා අදාල ක්ෂේත්‍ර වල නිෂ්පාදනය ඉහල දැමීම සඳහා පමණක් භාවිතා කරන බවට සහතිකයක් ලබා දීම.

**(2.2.)** අත්‍යාවශ්‍ය ආහාර සඳහා පමණක් බල පැවැත්වෙන පරිදි සුපිරි වෙළඳ සැල් වලින් ලබා ගන්නා ඉහල කොමිස් මුදල් අඩු කිරීම සඳහා පාරිභෝගික අධිකාරී පනත් යටතේ සීමාවක් පැණවීම. (එමගින් නිෂ්පාදකයා රැක ගන්නා අතර පාරිභෝගිකයාටද සාදාරනය ඉටු කිරිම)

**(2.3)** දේශීය නිෂ්පාදන මහ ජනයා අතර ප්‍රචලිත කිරීම සඳහා රජය විසින් පුද්ගලික අංශයේ සහය ඇතිව රජයේ මාධ්‍ය භාවිතා කරමින් අධ්‍යාපන සහ ප්‍රචාරක වැඩපිළිවෙළක් දියත් කිරීම.

**(2.4)** රජය රටේ විශාලතම මිල දී ගන්නා ලෙස දේශීය නිෂ්පාදන මිල දී හැනීම සඳහා අනිවාර්ය ප්‍රමුඛතාවන් ලබා දීම සහ ඒවායේ මිල මට්ටම් 10% ට වැඩි මට්ටමකින් ටෙන්ඩර් කැදවීමට අවසර ලබා දීම.

**(2.5)** ස.තො.ස. සහ සමුපකාර ජාලය අත්‍යාවශ්‍ය ආහාර සහ දේශීය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රමුඛතාවන් ලබා දීම අනිවාර්ය කිරීම. එළවළු වෙළඳපල තුල පවතින අකාර්යක්ෂමතාවයන් අඩු කිරීම සඳහා රජයේ මැදිහත් වීමෙන් මිළ දී ගැනීමේ සහ

විකිණීමේ සමුපකාර ජාළයක් පිහිටුවීම හෝ අතීතයේ පැවති "මාක්ෆ්‍රඩ්" වැනි ආයතනයක් පිහිටුවීම.

**(2.6)** රට තුලදී ආනයනික ආහාර වර්ග මිශ්‍ර කිරිම මගින් එවායේ තත්වය බාල කිරිම සහ එමගින් මිළ අඩු කිරිම හරහා වෙළඳපල තුල මිළ විකෘතීන් ඇති කිරිම වැලැක්විම මගින් දේශිය නිෂ්පාදන පද්දතිය සහ මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරිම. ඒ අනුව පලමු වටයේදි පොල් තෙල් වලට වෙනත් තෙල් වර්ග මුශ්‍ර කොට ආනයනය කිරිම හෝ විකිණිම මෙන්ම කිරිපිටි වලින් කිරි මේදය ඉවත්කොට ඒ වෙනුවට ෆාම් තෙල් යෙදු කිරිපිටි ආනයනය සහ විකිනිම නැවැත්විය යුතුය.

**(2.7)** මව්බිම ලංකා පදනමේ සහය ඇතිව ඉහත (1.5) සදහන් කල මහා පරිමාණ කර්මාන්ත ජාලය ආරම්භ කිරීම සදහා උපාය මාර්ගික සංවර්ධන පනත් යටතේ අවශ්‍ය සහය ලබාදීම සදහා කර්මාන්ත අමාත්‍යාංශය යටතේ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම. (මුල් වටයේදී මහාපරිමාණ කර්මාන්ත 10ක් පමණ ආරම්භ කිරීමේ හැකියාව ඇත)

**(2.8)** ආරක්ෂක හමුදා වල, විශේෂයෙන්ම සිවිල් ආරක්ෂක හමුදාව සතු පිරිස් බලය සහ සම්පත් යොදා ගනිමින් ඉංජිනේරු ඒකකයක් පිහිටුවීම මගින් ග්‍රාමීය කුඩා හා මධ්‍යම පරිමාණ වැව් සහ අමුණු සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ ඒ ආශ්‍රිත පරිසර පද්ධති සංවර්ධනය කිරීම. ඊට අමතරව රජයට අයත් ඵලදායීතාවය අඩු ගොවිපල සහ ඉඩම් ප්‍රමාණයක් යොදා ගනිමින් හමුදාව මගින් ආදර්ශ ගොවිපොළ ජාලයක් පිහිටුවීම සහ තරුණ තරුණියන් කෘෂි කර්මාන්තයට යොමු කිරීම සදහා පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම

**(2.9)** ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩළය සතු ගොවිපල පද්ධතීන් යොදා ගනිමින් කිරි ගව අභිජනන ජාතික වැඩසටහනක් ආරම්භ කිරීම මගින් ගොවීන්ට පැටව් ලබා දීම. (විදේශීය රටවලින් දෙනුන් ආනයනය කිරිම අභිජනන කටයුතු සදහා පමණක් සීමා කිරීම.)

**(2.10)** ආරක්ෂක හමුදා සතු සම්පත් සහ තාක්ෂණික විද්‍යාල පහසුකම් සියල්ල යොදා ගනිමින් මුළු රටම තාක්ෂණික වෘත්තීය පුහුණු කදවුරක් බවට පත් කිරීම මගින් දේශිය සහ විදේශිය රැකියා අවස්ථා වර්ධනය කිරිම සහ නුපුහුණු කාන්තා ශ්‍රමිකයින් විදේශ රැකියා සදහා යැවීම නැවැත්වීම.

අධ්‍යක්ෂක මණ්ඩලය

මව්බිම ලංකා පදනම

2020 දෙසැම්බර් 23 වන දින.